පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
6

# දෙවන වාර පරීක්ෂණය - 2019

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ..................................................
..........................................................................................................

කාලය : පැය 02 යි.

## *ඉතිහාසය I , II*

### ඉතිහාසය - I

**සැලකිය යුතුයි :**

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

▪ **ප්‍රශ්න අංක01 - 05 දක්වා ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ශ්‍රී ලංකාවේ පැරණිතම සාහිත්‍යමය මූලාශ්‍රය වන්නේ,

1) මහා වංශය 2) දීපවංශය 3) බෝධිවංශය

02. මහසෙන් රජුගේ පාලන කාලය ආරම්භ වූයේ,

1) ක්‍රිස්තු වර්ෂ 274 දීය. 2) ක්‍රිස්තු වර්ෂ 67 දීය. 3) ක්‍රිස්තු වර්ෂ 1 දීය.

03. මිනිසෙකු වීමට නැඹුරුවක් ඇති කළ පැරණිතම වානරයා හඳුන්වන්නේ,

1) හෝමෝ හැබිලස් ලෙසය.

2) ඔස්ට්‍රලෝපිතිකස් ලෙසය.

3) හොමෝ ඉරෙක්ටස් ලෙසය.

04. වෙඩි බෙහෙත් ලොවට හඳුන්වා දෙනු ලැබූ ශිෂ්ටාචාරය කුමක් ද ?

1) මායා ශිෂ්ටාචාරය

2) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය

3) චීන ශිෂ්ටාචාරය

05. පෘථිවියේ අධික ශීතල දේශගුණය උණුසුම් වී පසුව ආරම්භ වූ සාරවත් යුගය හැඳින්වෙන්නේ,

1) සිලුරියන් යුගය ලෙසය.

2) මහා හිම යුගය ලෙසය.

3) හොලෝසින යුගය ලෙසය.

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්න වල හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර ඉදිරියේ ඇති වරහන තුළින් තෝරා ලියන්න.**

06. අප ජීවත්වන පෘථිවි ගෝලයේ මැද කොටස ............................................... ක් පමණ උෂ්ණත්වයකින් යුක්ත වේ.

( සෙල්සියස් අංශක 6000 / සෙල්සියස් අංශක 600 )

07. පොළොන්නරු ගල් විහාරය ............................................................ රජතුමා විසින් ඉදිකරන ලදී.

( පළමුවන පරාක්‍රමබාහු / මහසෙන් )

08. මහම්මත්තුමා මක්කම සිට මදීනා නගරයට පැමිණි වර්ෂය මුල්කරගෙන ............................ වර්ෂ ආරම්භ වී ඇත.

( ශක / හිජ්රි )

09. මුහුදු පතුලේ ජීවත් වූ ආහාර ගැනීමට මුඛයක් හා ඇස් පහකින් යුතු ජීවයා ................................................ ලෙස හැඳින්වේ.

( ඔපබීනියා / ප්‍රොකායෝට් )

10. මිනිසා විසින් පළමු වරට ගින්දර භාවිතා කළ බවට සාක්ෂි ..................................................... හමුවේ.

( ඊශ්‍රාලයෙන් / කැනඩාවෙන් )

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට පහත 'අ' තීරයට ගැලපෙන පිළිතුර 'ආ' තීරයෙන් ගළපා ඊට අදාළ අක්ෂරය ඉදිරියේ ඇති තිත් ඉරි මත ලියන්න.**

| 'අ' තීරය | | | 'ආ' තීරය |
|---|---|---|---|
| 11. ලෝකයේ පැරණිම අක්ෂර පද්ධතිය අයත් වන්නේ | (...........) | A. | ඉන්දු නිම්න ශිෂ්ටාචාරය |
| 12. පිළිස්සු මැටි ගඩොල් භාවිතා කර නිවාස සාදා ගැනීම | (...........) | B. | මායා ශිෂ්ටාචාරය |
| 13. ලෝකයේ පැරණිම නීති පොත සකස් කර ඇත්තේ | (...........) | C. | හමුරාබි |
| 14. මුල් වරට රබර් බෝලය සොයා ගත්තේ | (...........) | D. | පාරාවෝ |
| 15. ඊජිප්තු ශිෂ්ටාචාරයේ රජ පෙළපත හඳුන්වා ඇත්තේ | (...........) | E. | චීන ශිෂ්ටාචාරය |
| | | F. | මෙසපොතේමියානු ශිෂ්ටාචාරය |

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ඇති ප්‍රශ්න වලට අදාළ ප්‍රකාශයන් නිවැරදි නම් ( ✓) ලකුණ ද, වැරදි නම් ( ✗) ලකුණ ද, ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

16. මහා හිම යුගයේ දී මැමත් අලි ජීවත් විය. (.........)
17. ලෝකයේ මුලින්ම ජීවීන් බිහිවූයේ ගොඩබිමෙහි ය. (.........)
18. ගිනිකඳු පුපුරන විට ඉන් පිටතට "ලාවා" ගලා එයි. (.........)
19. ඇසිරියන්වරු මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ දක්ෂ වෙළඳුන් ය. (.........)
20. තම්බපණ්ණිය ලංකාවේ නැගෙනහිර වෙරළේ පිහිටා ඇත. (.........)

(ල. 20 × 2 = 40)

***

For more past papers and exam resources,visit www.pastpapersszone.lk


## ඉතිහාසය- II

**සැලකිය යුතුයි :**

❖ **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) මිනිසාගේ සංස්කෘතික දියුණුවට අයත් ප්‍රධාන අවධි තුන නම් කරන්න. (ල:03)

(ii)



A) මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද ?

B) මෙය සෑදීමට යොදා ගෙන ඇති අමුද්‍රව්‍ය නම් කරන්න.

C) මෙය භාවිතා කළ මානව වර්ගය නම් කරන්න.

D) මෙය නිර්මාණය කර ඇත්තේ අදින් වසර කීයකට පෙර ද? (ල: 04)

(iii) A දියුණු මානවයෙකු වූ හෝමෝ නියැන්ඩතාලන්සිස්ගේ ජීවන රටාව පිළිබඳ ලක්ෂණ තුනක් ලියන්න.

B හෝමෝ නියැන්ඩතාලන්සිස්ගෙන් පසු බිහි වූ මානවයා කවුද? (ල: 05)

02. (i) ඉතිහාසය ඉගෙනීමට ප්‍රයෝජනවත් වන පුරා විද්‍යා මූලාශ්‍ර තුනක් ලියා දක්වන්න. (ල: 03)

(ii) ඉතිහාසයේ කාලය මැන ගැනීමට සුලබ වශයෙන් භාවිතා වන ක්‍රම දෙක නම් කරන්න. (ල: 04)

(iii) ඉතිහාසය ඉගෙන ගැනීමෙන් ඔබට ලබාගත හැකි ප්‍රයෝජන තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ල: 05)

03. (i) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ වැසියන් ඇදහූ පහත සඳහන් දෙවිවරුන් හැඳින්වූයේ කුමන නමකින් දැයි ලියා දක්වන්න.

A) - දේව මණ්ඩලයේ ප්‍රධානියා -

B) - පොළොවට අධිපති -

C) - සුළඟට සහ ගොවිතැනට අධිපති - (ල: 03)

(ii) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයට අයත් ගංගා නිම්න දෙක නම් කරන්න. (ල: 04)

(iii) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ පැවති සමාජයේ ලක්ෂණ පහක් සඳහන් කරන්න. (ල: 05)

04. (i) ගොවිතැන ආරම්භයේදී මිනිසුන් පහත ධාන්‍ය වර්ග වගා කර ඇත. එම ධාන්‍ය වර්ග සොයා ගත් ප්‍රදේශ මොනවාදැයි A , B හා C පිළිවෙලින් ලියා දක්වන්න.

A) බඩ ඉරිඟු -

B) තිරිඟු -

C) වී -

(ii) පරිසර වෙනස්කම් අනුව හෝමෝ සාපියන් මානවයා බෙදිය හැකි වර්ග හතර ලියන්න. (ල: 04)

(iii) මිනිසා ගොවිතැනට යොමු වීමත් සමග ඔහුගේ සමාජයේ සිදුවූ වෙනස්කම් පහක් සඳහන් කරන්න. (ල: 05)

05. (i) මිනිසා ස්වභාව ධර්මයට අයත් සත්ත්වයෙකි. එහෙත් මිනිසා වෙනත් සතුන්ට වඩා හැකියාවන්ගෙන් ඉදිරියෙන් සිටින බවට කරුණු තුනක් ලියන්න. (ල: 03)

(ii) පහත සඳහන් වගුවේ හිස්තැන් පුරවන්න.

| සොයා ගැනීම | මානවයා |
|---|---|
| ගලකින් ගලක් කඩා ඉන් මුවහත් මුහුණක් සාදා ගැනීම | A ........................................ |
| B ........................................ | හොමෝ ඉරෙක්ටස් |
| සත්ව ඇටකටු වලින් නිවාස තනා ගැනීම | C ........................................ |
| D ........................................ | හෝමෝ සාපියන් |

(ල: 04)

(iii) පුරාශිලා යුගයේ ජීවත් වූ මිනිසුන්ගේ ජීවන රටාව පිළිබඳ කරුණු දෙකක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල: 05)

06. (i) ගල් යුගයේ මිනිසා මෙවලම් සෑදීමට යොදා ගත් අමුද්‍රව්‍ය තුනක් ලියන්න. (ල: 03)

(ii) විජය කුමරු ලංකාවට පැමිණෙන විට සිටි යක්ෂ ගෝත්‍රිකයන් විසූ නගර දෙක නම් කරන්න. (ල: 04)

(iii) ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස වල සිටි මිනිසුන්ගේ ජීවන රටාව පිළිබඳ කරුණු තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල: 05)

07. (i) පණ්ඩුකාභය රජතුමාගේ මව, පියා, ගුරුවරයා නම් කරන්න. (ල: 03)

(ii) පණ්ඩුකාභය රජතුමාගේ ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න. (ල: 04)

(iii) දේවානම්පියතිස්ස රජතුමා විසින් ඉටු කල ශාසනික සේවාවන් තුනක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ල: 05)

***

For more past papers and exam resources,visit www.pastpaperszone.lk